## ජී.ජී. රූපසිංහ එ. ශ්‍රී ලංකා පොලිසිය

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/ 1946/2020 (2020.07.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණි වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - ජී.ජී. රූපසිංහ
නොතිසි ලත් පාර්ශවය - නම්කළ නිලධාරී, පොලිස් මූලස්ථානය
පොලිස්පතිතුමාගේ මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පති, පොලිස් මූලස්ථානය
සහකාර පොලිස් අධිකාරී, පොලිස් මූලස්ථානය, හදිසි ඇමතුම් අංශය (119) මිරිහාන, නුගේගොඩ

**පෙනීසිටීම**
මෙය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.06.21 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.09.18 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.10.12 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.06.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

> ***2014 මාර්තු 14 හෝ ආසන්න දිනක දියපලාගොඩ ශ්‍රී චන්ද්‍රාරාම පුදබිමට හානි කිරීම සම්බන්ධව දුන් පණිවිඩය ලබා ගැනීමට***

තොරතුරු නිලධාරියා පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාචක 2019.09.18 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකරන ලදි. නම්කළ නිලධාරියාද පනතේ සඳහන් සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත්වීම මත අභියාච 2019.10.12 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

රට තුල COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ තොරතුරු ඉල්ලීම සම්බන්ධව ප්‍රතිචාර දැක්වීමට තොරතුරු නිලධාරියා හා නම්කළ නිලධාරියා කටයුතු කර නොමැති බවයි. ඒ අනුව තොරතුරු දැනගැනීමේ පනතේ 24(3) වගන්තියේ සඳහන් පරිදි *"ඉල්ලීමක් ලැබීමේදී එම ඉල්ලීම ඉදිරිපත් කළ පුරවැසියා වෙත තොරතුරු නිලධරයෙකු විසින් වහාම එම ඉල්ලීම ලැබීම පිළිබඳ ලිඛිත දැනුම්දීමක් යොමුකරනු ලැබිය යුතුය"* යන්න හා 25 (1) වගන්තියේ සඳහන් පරිදි *"තොරතුරු නිලධරයෙකු විසින්, හැකි ඉක්මණින් සහ කෙසේ වූවද 24 වන වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබී දින 14ක් ඇතුළත...... ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට හෝ මේ පනතේ 5 වන අවගන්තියේ දක්වා ඇති හේතුවලින් යම් එක් හේතුවක් හෝ ඊට වඩා ගණනක් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ තීරණය කළ යුතු අතර එම තීරණය ඉල්ලීම කා පුරවැසියා හට වහාම සන්නිවේදනය කළ යුතුය"* යන සිය ව්‍යවස්ථාපිත වගකීම සිදුකර නොමැති බවයි.

එසේම නම්කළ නිලධාරියාද පනතේ 31(2) වගන්තිය අනුව එනම් *" නම්කළ නිලධරයා විසින් ඕනෑම අවස්ථාවකදී එසේ වුවත් වැඩකරන දින තුනක කාලයක් ඇතුළත අභියාචනය කරනු ලබන පුරවැසියා වෙත එම අභියාචනය භාර ගැනීමේ දී කුවිතාන්සියක් නිකුත් කළ යුතුය"* හා 31(3) වගන්තියේ සඳහන් පරිදි *"නම්කළ නිලධාරියා විසින් (1) වන උප වගන්තිය යටතේ සඳහන් කර ඇති යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබී සති තුනක කාලයක් ඇතුළත ලබාදිය යුතු අතර ඒ සඳහා නිශ්චිත පදනම ඇතුළුව එම තීරණය සඳහා වූ හේතු දැක්විය යුතුය"* යන සිය ව්‍යවස්ථාපිත වගකීම ඉටුකර නොමැති බව නිරීක්ෂණය කර සිටී.

මෙහිදී, පොදු අධිකාරිය විසින් 2020.11.17 දිනැතිව යොමුකර ඇති ලිපිය කෙරෙහි කොමිෂන් සභාවෙහි අවධානය යොමුවිය. එහි සඳහන් වන්නේ,

2014.03.24 දින හෝ ඊට ආසන්න දිනයක දී අභියාචක විසින් 119 පොලිස් හදිසි ඇමතුම් අංශය වෙතෙ ශ්‍රී චන්ද්‍රාරාමය විනාශ කිරීම සම්බන්ධව කරන ලද පැමිණිල්ලට අදාළ විස්තර ලබා දෙන ලෙස 2019.09.09 වන දින අභියාචක වෙත පොලිස්පති අණදෙන තොරතුරු කොට්ඨාසයේ අධ්‍යක්ෂතුමා යොමුකරන ලද D/IR/OUT/4540/2019 දරණ ලිපිය අනුව එයට අදාළව අභියාචක විසින් 2014.03.24 වන දින හෝ ඊට ආසන්න දිනකදී 119 පොලිස් හදිසි ඇමතුම් අංශය වෙත ලබා දෙන ලද තොරතුරු සම්බන්ධව පරීක්ෂා කරන ලදි.

එහිදී අභියාචක විසින් ලබා දෙන ලද තොරතුරු පරීක්ෂා කළ අතර එම කාල සීමාවේ 119 මධ්‍යස්ථානය මඟින් ලේඛනගත කරනු ලබන යූ.ටී.ආර්. පණිවිඩ ඇතුළත් ලේඛන වර්ෂයක් පමණ ගත වූ පසුව විනාශ කරනු ලබන බැවින් 2014 වර්ෂයේ ලේඛන 2015 වර්ෂයේදී විනාශ කර ඇති බැවින් තොරතුරු ලබාදීම

සිදුකළ නොහැකි බවට 2019.10.10 වන දින අධ්‍යක්ෂතුමා පොලිස්පති අණදෙන තොරතුරු කොට්ඨාසය වෙත ලිපියක් මඟින් අභියාචක විසින් යොමුකරන ලදි.

මෙම ලිපිය මඟින් ඉහත අභියාචක විසින් ඉල්ලුම්කර ඇති කාල සීමාව තුළදී ලේඛන විනාශ කර ඇති බවත්, එම කාල සීමාව වන විටදී තොරතුරු දැනගැනීමේ පනත බලාත්මක නොවූ හෙයින් එයට අදාළ ලේඛන නිවැරදි ක්‍රමවේදය යටතේ විනාශ කර ඇත. මේ සම්බන්ධව මීට පෙර පොලිස්පතිතුමා වෙත නි.පො.ප. (ප්‍රවාහන හා සංදේශ) තුමා මඟින් ලිපියක් මඟින් දැනුම්දීමෙන් අනතුරුව පොලිස්පතිතුමාගේ නියෝග මත ඉහත පැමිණිලිකරු වෙත 2014 වර්ෂයට අදාළ ලේඛන විනාශ කර ඇති හෙයින් එම සිදුවීම සම්බන්ධව තොරතුරු ලබා දීමට නොහැකි බවට දැනුම් දී ඇත.

මෙම කරුණු සම්බන්ධව නැවත වරක් ඉහත අභියාචක වෙත මෙම ලේඛන විනාශ කර ඇති හෙයින් අදාළ සිදුවීමට සම්බන්ධ තොරතුරු ලබාදීමට හැකියාවක් නොමැති බවට දැනුම්දීමට කටයුතු සිදුකරන බව කාරුණිකව දැනුම් දෙන බවයි.

ඒ අනුව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් නිසි ක්‍රමවේදය අනුව විනාශ කිරීම මත එම තොරතුරු තවදුරටත් පොදු අධිකාරියෙහි පාලනයේ, භාරයේ හා සන්තකයේ නොමැතිවීම මත ලබාදීමට හැකියාවක් නොමැති බවයි.

නියෝගය:

ඒ අනුව අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය විසින් මේ වනවිටත් නිසි ක්‍රමවේදය අනුව විනාශ කර තිබීම මත අදාල තොරතුරු පොදු අධිකාරියෙහි පාලනයෙහි, භාරයෙහි හා සන්තකයේ නොමැති වීම මත එම තොරතුරු අභියාචක වෙත ලබා දීමට හැකියාවක් නොමැති බවයි.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****